සැ. යු.- 2014.02.07 දින පළ වූ අංක 1,849 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,850 - 2014 පෙබරවාරි 13 වැනි බ්‍රහස්පතින්දා - 2014.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 124 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මාර්තු මස 07 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 පෙබරවාරි මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

123 - B 80811 — 300 (2014/02)
D 1 -

# විවිධ දැන්වීම්

## බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී සිවිල් අධිකරණ බලතල ක්‍රියාත්මක කිරීම (කොළඹ දී පවත්වනු ලබන) ඇවර කිරීමක් පිළිබඳ දැන්වීම

නඩු අංක : 57/2013/CO

ස්වභාවය : ඇවර කිරීම සහ

කොළඹ 03, ගාලුපාර, අංක 451 ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන පීසී හවුස් පීඑල්සී පිළිබඳ කාරණාවේ දී ය.

2007 අංක 07 දරන සමාගම් පනතේ XII වැනි පරිච්ඡේදය යටතේ හා සම්බන්ධයෙන් උසාවිය මගින් සිදුකිරීම සඳහා වූ ඉල්ලීම පිළිබඳ කාරණාවේ දී -

1. වර්ල්ඩ් වයිඩ් කම්පියුටර්ස් එල්අයිසී,
   අංක 10850, එන්ඩබ් 21, ස්ට්‍රීට් සූට් 110,
   මියාමි, එෆ්එල් 33172, ඇ.එ.ජ.

වෙනුවෙන් කොළඹ 10, රම්‍යා පෙදෙස, ජාතික නිවාස සංකීර්ණය, 2/4 අංක බී 2, පදිංචි, නීතිඥ නරසිම්මන් නඩරාජා උදයකුමාර් නිසි පරිදි පෙනී සිටියි.

2. ටෙක් ඇෆ්රිකන් ඩිස්ට්‍රිබියුටර්, එෆ්ඉසෙඩ්ඊ, යූඒඊ තැ. පෙ. 45158 ආර්.ඒ.එස්. අල් ඛයිමා, යූඒඊ වෙනුවෙන් කොළඹ 10, රම්‍යා පෙදෙස, ජාතික නිවාස සංකීර්ණය 2/4, බී 2, පදිංචි නීතිඥ නරසිම්මන් නඩරාජා උදයකුමාර් නිසි පරිදි පෙනී සිටියි.

.....................................................*පෙත්සම්කරුවන්.*

ඉහත නම සඳහන් සමාගම ඇවර කිරීම සඳහා බස්නාහිර පළාතේ මහාධිකරණයේ අධිකරණ බලතල ක්‍රියාත්මක කිරීම පිණිස ඇ.එ.ජ. එෆ්.එල්. 33172 මියාමි, ස්ට්‍රීට් සූට් 110 එන්, ඩබ්. 21, අංක 10850 හි වර්ල්ඩ්වයිඩ් කම්පියුටර්ස් එල්අයිසී සහ යූඒඊ, ආර්ඒඑස් අල්ඛයිමා, තැ. පෙ. 45158 හි, ටෙක් ඇෆ්රිකන් ඩිස්ට්‍රිබියුෂන් එෆ්. ඉසෙඩ් ඊ සමාගම විසින් ඉහත සඳහන් උසාවිය වෙත 2013 දෙසැම්බර් 19 වැනි දින ඉදිරිපත් කරන ලද පෙත්සම, 2014 මාර්තු 03 දින උසාවියේ විභාග කිරීමට නියමිත අතර, මෙම සමාගමේ ණයකරුවෙකු හෝ සහදායකයකු විසින් මෙම පෙත්සම සම්බන්ධයෙන් නියෝගයක් නිකුත් කිරීම සඳහා සහය වනු පිණිස හෝ විරුද්ධත්වය දැක්වීමට කැමැත්ත දක්වයි නම් මෙම විභාගයේ දී පෞද්ගලිකව හෝ තම නීතිඥවරයා මගින් ඉදිරිපත් විය හැකි අතර, මෙහි පහත නම් සඳහන් අය වෙත නියමිත ගාස්තුවක් ගෙවීම මත එම ණයකරු හෝ සහදායකයා වෙත ඉහත කී පෙත්සමේ පිටපතක් සපයනු ලැබේ.

එම්. අයි. එම්. ඉෂාර්,
අංක 18, ප්‍රනාන්දු ගාඩ්න්ස්, දෙහිවල.

*සටහන.*-ඉහත සඳහන් පෙත්සම් විභාගයේ දී පෙනී සිටීමට අදහස් කරන ඕනෑම පුද්ගලයෙකු ඉහත නම් සඳහන් එම්. අයි. එම්. ඉෂාක් වෙත තැපෑලෙන් හෝ පෞද්ගලිකව හෝ දැන්වීමක් භාර දිය යුතු ය. දැන්වීමේ පුද්ගලයාගේ නම සහ ලිපිනය ද, සමාගමක් නම් සමාගමේ නම සහ ලිපිනය සමග පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහු හෝ ඔවුන්ගේ නීතිඥ මහතා (කිසිවකු ඇත්නම්) අත්සන් කොට භාරදීම කළ යුතු ය. තැපෑලෙන් එවන්නේ නම් ඉහත නම් සඳහන් අය වෙත කල් වේලා ඇතිව 2014 මාර්තු 02 දින ප. ව. 6.00ට පෙර ලැබෙන පරිදි එවිය යුතු ය.

පෙත්සම්කරුවන් වෙනුවෙන්
පෙනී සිටින නීතිඥ.

02-311

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.